# එහෙමයි හාමුදුරුවනේ

රේෂිකා රුවනි දිව්‍යාංජලී

# එහෙමයි හාමුදුරුවනේ


රේෂිකා රුවනි දිව්‍යාංජලී

කතෘ

පාසල- මා/බුද්ධඝෝෂ ජාතික පාසල- පලාපත්වල- මාතලේ

ශ්‍රේණිය - 13 වානිජ



කෘතිය පළකරන දිනය - 2025-02-08

## විදුහල්පතිගේ ප්‍රකාශය

වත්මන් ගෝලීයකරණය වන ලෝකයේ දරු දැරියන් කියවීමෙන් දුරස්ව සිටින ස්වරූපයක් දක්නට ලැබෙන අවස්ථාවක මහනුවර මහාමායා විද්‍යාලය මඟින් පවත්වනු ලබන හෙරණගත්කරණී වැඩසටහන පැසසුමට ලක්කරමි.

දුවාදරුවන්ගේ නැණස වර්ධනයකරන මෙවැනි වැඩසටහන් ඉදිරියටත් සිදු කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

එමෙන්ම මා/බුද්ධඝෝෂ ජාතික පාසල නියෝජනය කරමින් වැඩසටහනට සහභාගි වන දරු දැරියන්ට සුභාසිශංන එක් කරමි.

A.J.අතුල සහම්පත්

විදුහල්පති

මා/බුද්ධඝෝෂ ජාතික පාසල

## නියෝජ්‍ය විදුහල්පතිනියගේ ප්‍රකාශය

හෙරණගත්කරණී වැඩසටහන මහතලා පුරවරයන් දිරිපත් වන දුවා දරුවන්ට සුභාශිංෂණය පිරිනමන අතර නූතන සමාජය තුළ සාහිත්‍ය රස වනිදනය කිරීම මිනිස් සමාජය තුළින් ක්‍රමයෙන් ඈත් වෙමින් පවතින කාල සීමාවක මහමායාවේ දියණිවරුන් විසින් සිදු කරන හෙරණගත්කරනේ වැඩසටහන තුළින් අප රටේ ශ්‍රේෂ්ඨ ගත්කරුවන් බිහිවේවායි ප්‍රාර්තනාකරමි.

R.M.S.P.K.රත්නායක

නියෝජ්‍ය විදුහල්පති

# <u>පිදුම</u>

කුස පිළිසිඳගත් දා සිට අද වනතුරු මා හදාවඩා ගත් ආදරණීය මෑණියන්ට හා

පියානන්ට මෙන්ම අකුරු කරන්නට මා ගොඩවූ විදුහලේ

විදුහල්පති- A.J.අතුල සහම්පත් විදුහල්පතිතුමාට

පුස්තකාලාධිපතිතුමියට මෙම පොත පුදමි.

# පෙරවදන

ධනවාදී පන්තියක් මෙම ගම්මානයේ නොවීය. සියල්ලෝම ගොවිතැනින් දිවි ගෙවූවෝ වූහ.

උකාලයේ වූ මහ විපතින් ගම්මානය අභාවයට යමින් තිබූ වකවානුවක ලොකු හාමුදුරුවන්ගේ හැසිරීම පැසසිමට ලක් විය යුතුය.

මහා කාර්යභාරයක් නිම කොට වුව ද අවසානයේ නික්ම යාම සියල්ලන්ට ම පොදු ස්වාභාව ධර්මයේ නීතියයි.

-රේෂිකා රුවනි-

# එහෙමයි හාමුදුරුවනේ

අනිත්‍යතාව මෙනෙහි කරමින් බෝ හාමුදුරුවන්ගේ නටුවෙන් ගිලිහුණු බෝපත් මඳ සුළඟේ ලෙලෙමින් බෝ මළුවේ සැතපෙයි. බෝපතින හැඩවුණු බෝ මළුව අමදින සංවර ශික්ෂාකාමී රුවනකි. භාවනාවක ස්වරූපය ගත් ලොකු හාමුදුරුවන්ගේ මළු අමදින ලොකු හාමුදුරුවන්ගේ මළු ඇමදීම දකින කාගේත් සිත් සතන් දැහැන් ගතවන බව නොඅනුමානය.

අවසරයි ලොකු හාමුදුරුවනේ ලොකු හාමුදුරුවන්ගේ දෙපා නැමද එකත්පස් වූ ගමේ වැඩිහිටියන් තිදෙනෙකි.

මොකෝ මේ ඇත්තේ මේ පැත්තේ

හාමුදුරුවනේ අපි මේ ආවේ ගමට වෙලා තියෙන වින්නැහිය ගැන කතා කොරන්න

මං හිතන්නේ වැව ගැන වෙන්න ඇති

එහෙමයි හාමුදුරුවනේ ඔබවහන්සේ තවම ක්‍රියාමාර්ගයක් නොගත්ත නිසයි අපි මේ කතා කරන්න ආවේ

දැක දැකත් නොදැක්කා වගේ හිටියා නෙවෙයි සුගතන් පහුගිය දවස් ටිකේ අසනීපෙන් උන්නු නිසයි මොකුත් කර ගන්න බැරි උනේ. අපේ මේ වෙද මහත්තයා එක්කත් මං මේ ගැන කතා කළා.

එහෙමයි හාමුදුරුවනේ වෙද මහත්තයා ලොකු හාමුදුරුවන්ගේ කථාව අනුමත කලේය.

දැන් අපි මේකට මොකද්ද කරන්නේ හාමුදුරුවනේ

අර කාලකන්නි වැව් පොඩ්ඩ විනාශ කළා කියලා උන්ට වෙච්ච වින්නැහියක් නෑ කණකොකා හඩලැව්වේ අපේ ගමටමයි.

මේක මේ අපි දෙතුන් දෙනාට ගන්න පුළුවන් තීරණයක් නෙවෙයි. ගම්මු ටික රැස් කරලා කතිකා කරගමු මොකද්ද කරන්නේ කියලා. හෙට හැන්දෑ කොරේ හැමදෙනාටම ධර්මශාලාවට රැස් වෙන්න කියල පණිවිඩයක් යවමු.

බෝ මළුව මත පොල්අතු රටාවට හැඩවුණු කොටසේ දෙපා සටහන් තබා ඔවුන් පිටවී ගිය පසු ඒ පියසටහන් ඔස්සේ ලොකුහාමුදුරුවන්ගේ හිත අතීතයට ගමන් කලේය.

වසර ගණනාවක් පුරා ගම්මාණය සාරවත් කළ වැව් කොමලිය හිදී ගොස් ඇත. අක්කර දෙකක පමණ භූමි ප්‍රදේශයක් යටත් කරගෙන රජ කළ දිය කිදුරිය අද වන විට කුඩා උල්පත් දෙක තුනකට සීමා වූයේ මිනිසුන්ගේ නොමනා ක්‍රියා කළාපයන් නිසාය.

ගියවර පැවති මැතිවරණයේදී ප්‍රදේශයේ මන්ත්‍රීතුමා වැව ප්‍රතිසංස්කරණය කරන බව පවසා වැව් ජලය පිටවර වැව් බැම්ම කපා දමා ප්‍රතිසංස්කරන කටයුතු ඇරඹුවත් එම කටයුතු බල පැවැත්වූයේ උපරිම සතියකි. ඡන්දයෙන් පසු අදාල

මන්ත්‍රීතුමා හෝ කිසිදු නිලධාරියෙකු වැව ගැන ඇහැක් ඇර නොබැලූ තරම්ය. ඉන් වැඩිම හානිය සිදු වූයේ වැව් ජලයෙන පෝෂණය වූ පවුල් හැටක් පමණ ජීවත් වන ගෙලිගස්ගම ගම්මානයටය. මේ ගම්මානයේ බොහෝ දෙනා ගොවිතැනින් සිය ජීවිත සරි කර ගැනීමට ඊට හේතුවයි.

යම්කිසි වගකිවයුතු නිලධාරියෙකු පැමිණ කුමක් හෝ කරතියි යන විශ්වාසයෙන් මාස තුනක් ගෙවා දැමීමට ගම්මුන්ට සිදු විය. එහෙත් කුමකින් කමක්වත් සිදු නොවූ තැන මේ ප්‍රශ්ණයට මැදිහත් වීමට ලොකු හාමුදුරුවන්ට සිදු විය.

එනමුත් උන්වහන්සේට දැන් පෙර මෙන් කය වෙහෙසා කටයුතු කළ නොහැක. අසූ තුන්වන වියට පත් උන්වහන්සේ දැන් කායිකව දුර්වල වෙමින් සිටී. එහෙත් උන්වහන්සේගේ චිත්ත ශක්තිය කායික ශක්තියට වඩා දස දහස් ගුණයක් ප්‍රබලය

මං කියන්නේ දැනටමත් මේ ඇත්තෝ දන්නවා ඇති මොකටද මේ සභාව රැස් වුනේ කියලා. ගමම සාරවත් කොරාවු වැව සිදුනට පස්සේ මේ ගම දැන් ටිකෙන් ටික අඩපන වීගෙනයි එන්නේ. කිසිම නිලධාරියෙක් මේ ගැන සොයා බැලුවේ නෑ. අපිට තමයි මේකට මොකක් හරි කරන්න වෙන්නේ ඉතිං මෙතන ඉන්න කවුරුහරි යෝජනා කරමු බලන්න මේකට මොකක් ද කරන්න සුදුසු කියලා.

මීයට පිම්බාක් මෙන් දැඩි නිශ්ශබ්ධතාවයක් සභාව පුරා පැතිර යත්ම චතුර කටහඬක් ඇසෙන්නට විය.

අපි පෙත්සමක් ඉදිරිපත් කරමු හාමුදුරුවනේ.

ග්‍රාමසේවක මහතා රැස්ව සිටි පිරිස අතරින් ඉදිරියට පැමිණෙමින් පැවසීය.

රැස්ව සිටි සියල්ලෝ නැගී සිට ඔහු පිළිගත්තේය.

ඒක හොදයි ග්‍රාමසේවක මහත්තයෝ. අනික මහත්තයත් මේකට සම්බන්ධ වෙන එක අපට ලොකු හයියක්. එහෙනම් පෙත්සමේ වැඩකටයුතු ඔබතුමාගේ මූලිකත්වයෙන් වෙනවා නම් හොදයි.

එහෙමයි

ගම්මානයේ බෝහෝ දෙනා පෙත්සම යනු කුමක්දැයි දැන නොසිටියෝය. ඇතමුන් ඔළු කැසුවෝය. තවත් සමහරක් ළග උන්නුගේ මුහුණු බැලුවේය. තවත් සමහරෙක් කසු කුසු ගා රහස් මිමිණුවේය. මේ ඉගිබිගි තේරුම් ගත් ග්‍රාමසේවක මහතා පෙත්සමක් යනු කුමක්දැයි ගම්මුන්ට තේරුම් කර දුන් පසුව සියල්ලෝ ඊට කැමැත්ත පල කළෝය.

පෙත්සම ලියැවුණි. අත්සන් රැසක් ද එක්වුණි. ඇත්ත වශයෙන්ම මෙම ලේඛණය පෙත්සමකට වඩා සිතුවමකට හුරු විය. ඊට හේතුව වූයේ මෙහි ඇත්තටම තිබුණේ අත්සන් දෙක තුනකි. සෙසු අත්සන වෙනුවට යෙදුනේ ඔවුනොවුන්ගේ ඇගිලි වල තැවරුණු තීන්ත වලින් තැබූ ඇගිලි සළකුණුය. එම ඇගිළි සළකුණු ගැමියන්ගේ

අසරණකම විදහාපාන කැඩපතක් බඳුය. පෙත්සමේ වැඩි ප්‍රමාණයක් ඇඟිලි සලකුණු තිබීමෙන් ප්‍රකට වනුයේ මෙතරම් වේගයෙන් දියුණු වන ලෝකයක වුවද තවමත් හරි හැටි සංවර්ධනය නොවූ ගම්මානද ශේෂ වී ඇති බවයි.

පෙත්සම් නම් එකට දෙකක් දෙකට තුනක් ලියැවුණි. ප්‍රමාද වූයේ පිළිතුරුය. වැව සිඳී ගොස් දැනට මාස පහකටත් කිට්ටුය. ගම්මාණය දැන් නියගයකට හසු වූ ස්වරූපයක් පෙන්නුම් කරයි. පොළව ඉරි තළා ගොස්ය. වැව වටකර සුවඳ දුන් ඕලු නෙළුම් මානෙල් මල් කුමරියෝ අද එහි දක්නට නැත. වසර පුරා එල දැරූ ගස් කොළන් අද ගොළු වෙළාය. වැව සිඳි යාම නිසා ක්‍රමයෙන් අවට පිහිටි ඇළ දොළ ළිං පොකුණු හිඳී ගියේ නායකයෙකු නොමැති වූ විට කණ්ඩායමේ පැවැත්ම අස්ථිරය යන බව ප්‍රකට කරමින්ය. කෙමෙන් කෙමෙන් පවුලක් දෙකක් ගම අතහැර යන්නටත් විය. මේ ගැටලුවට ස්ථිර විසඳුමක් පතා ගම්මු නැවත පන්සලට රැස් වූවෝය.

තව දුරටත් මේ වෙන දේවල් මට බලාගෙන ඉන්න බෑ ග්‍රාමසේවක මහත්තයෝ. අපි මේ වෙනකොට මේ වෙනකොට පෙත්සම් කීයක් නම් ලිව්ව ද? ඒත් කෝ ඒවාට පිළිතුරු? කිසිම නිලධාරියෙක් මේ ගමේ පස් පෑගුවද? මේකත් නිකං බීරි අලීන්ට වීනා වයනවා වගේ. ඒ නිසා මං මේ ප්‍රශ්ණයට නීතියෙන් පිට පිළිතුරක් සොයාගත්තා. හැබැයි ඒකට මේ ඇත්තන්ගේ උදව්වක් ඕනි.

ඕන උදව්වක් කරන්නම් අපේ හාමුදුරුවනේ අපිටත් ඕනි මේ වැව හදාගන්න. වැව කඩා දාපු මන්ත්‍රීතුමා ඇමතිතුමෙක්ලු. ඒත් උන්ට ඡන්දය දීපු අපි ගැන උන්දැලට හාංකවිසියක්වත් මතක නෑ.

ඔව් සිරිල් ඒකමයි මං මේකට මෙහෙම තීරණයක් ගත්තේ

මේ ඇත්තන්ට මතකද කඩේ සෝමපාල මුදලාලිගේ පුතා මධුෂාන්

එහෙමයි හාමුදුරුවනේ අර අවුරුදු තුන හතරකට කලින් විභාගේ සමත්වෙලා විස්සවිද්‍යාලෙට තේරුණයි කිව්ව ළමයනේ

හරියට හරි ඒ ළමයා දැන් කොළඹ ඉන්ජිනේරු මහත්තයෙක්ලු. මං සෝමපාල මහත්තයා පන්සලට ආපු වෙලාවෙ මේ ගැන කතා කරලා ඒ දරුවටත් කතා කළා. ඉතිං ඉංජිනේරු මහත්තයා කැමති වුණා අපේ වැව හදලා දෙන්න.

අනේ විසනාවන් ඔය දරුවා එදා ඉඳලම ගුණ යහපත් ළමයෙක්. සීලවති ආච්චිට ඔහු කවරෙක්ද යන වගවත් මතක නැතත් ඔහුගේ ගුණ වැයුවේය.

හැබැයි ගැටලුවකට තියෙන්නේ

ලොකු හාමුදුරුවන් යමක් කීමට කටට ගත් නමුත් එය කීමට උචිත දැයි කල්පනා කළේය.

සල්ලි බාගෙද හාමුදුරුවනේ එහෙම ප්‍රශ්නයක් තියේ නම් හාමුදුරුවෝ අපිට කියන්න. අපි තියෙන ඉඩකඩම් හරි උකස් කරලා සල්ලි දෙන්නම්.

නැ නැ මේ ඇත්තො කළබල වෙන්න එපා. වියදම් ඉංජිනේරු මහත්තය දරන්නම් කීව. ගැටළුවකට තියෙන්නේ ශ්‍රමය සපය ගන්න එක. කොළඹ ඉදන් වැඩට මිනිස්සු ගෙන්න ගන්න ලොකු ගාණක් යනවලු.

මොකටද හාමුදුරුවනේ සල්ලි වලට වැඩට මිනිස්සු ගෙන්වන්නේ? කුඹුරු වැඩත් නතර වුණ එකේ ගමේ මිනිස්සු දැන් කුලී වැඩ කරන්නේ. අනික අපේ ගමේ වැව හදන්න අපිට උදව් වෙන්න බැරියැ මුළු ගමම එයි ඕන් වැඩ කරන්න.

හොදයි එහෙනම් මං ඉංජිනේරු මහත්තයට කියන්නම් ඒ ප්‍රශ්ණෙත් විසදුනා කියලා. මේ ඇත්තන්ට තියෙන්නේ ඒ මහත්තයා කියන විදියට වැඩ ටික කරන්න.

*** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** *** ***

සියල්ලන්ගේ බලාපොරොත්තු ඉටු කරමින් ඒ දවස එළැඹිණි. ගම්වැසියො සියල්ලෝම එයට සහභාගී වූයේ පිංකමකට සහභාගී වන්නා සේ සැදැහැ සිතින්ය. අසනීප තත්වයේ පසු වූවත් ලොකු හාමුදුරුවෝ එම කටයුත්තේ ආගමික වැඩ කොටස භාරගෙන ඉටු කළේය. පිරිත් කියා පිරිත් නූල් ගැටගසා සුභ මොහෙතින් වැව තැනීමේ කටයුතු ආරම්භ කළේය.

හිච්චි කොල්ලො කුරුට්ටෝ සේම මහලු උදවියත් ඉතා කඩිසරව එයට සහභාගී විය. ඇතැම මහලු උදවිය හැරමිටියට වාරු වෙමින් වැඩ කළේ අන් අයගේ විරෝධතා මැදය. කොල්ලො කුරුට්ටන්ට එය සෙල්ලමක් මෙන් වුවද විහිළු තහළු කරමින් ඉතා වෙහෙස වී එම කටයුත්තේ යෙදුණෝය.

ගැහැණු උදවිය ආහාර පානයෙන් රැස්ව සිටි සියළු දෙනාට සංග්‍රහ කල අතර තවත් බොහෝ කාන්තාවො වැව තැනීමේ කටයුතු වලට සහය විය. ගම්මුන්ගේ මේ මහන්සිය කැපවීම නිසාම සති දෙකක පමණ කාලයකදී වැව් බැම්ම සොරොව්ව සම්පූර්ණයෙන්ම තනා නිම කිරීමට හැකි විය.

වැව නිල්වන් ජලයෙන් පිරීමට ගතවූයේද දින කිහිපයකි. අසරණ ගම්මුන්ගේ කන්නලව්වලට කන් දුන් වැහි දේවතාවුන් නොකඩවා වැහි ළබා දුනි. එම වැස්ස ගමට සෞභාග්‍ය ගෙනා වැස්සක් විය. වැව සම්පූර්ණයෙන් පිරීමටත් එනිසා සියල්ලන්ගේ මුවගට සිනාවක් එක් කිරීමටත් එම වැස්ස හේතු විය.

වැව විවෘත කෙරුණේද පංසලේ ලොකු හාමුදුරුවන්ගේ අතිනි. ඒ බව සනිටුහන් කරමින් වැව් ඉස්මත්තේ නුග පැලයක් රෝපණය වූයේ ද උන්වහන්සේගේ අතිනි.

වැව නැවත වීම නිසා ගම නැවත උත්පත්තියක් ලැබුවා මෙන් විය. සිඳී ගිය දිය පහරවල් තද ගල් බොරළු පස තෙත් කරමින් උල්පත් උනන්නට විය.

කාලය මැව් අරුමය කියා පාන්නක් මෙන් අවුරුද්දක කාලයක් තුළ ගම නැවත ප්‍රකෘති තත්වයට පත් වී හමාරය. මේ කාලය තුළ වැව් ඉස්මත්තේ හිටවූ නුග පැළය අතු පතර විහිදා වැඩී විශාල නුගයක් වූ අතර ඊට සාපේක්ෂව ලොකු හාමුදුරුවන්ගේ සෞඛ්‍ය තත්වය පිරිහෙන්නට විය.

එක් කාළකණ්නි ගොම්මන් යාමයක මුළු ගමම ශෝකයට පත් කරවන පුවතක් පැතිරී ගියේය.

සුමනෝ සුමනෝ කොහෙද බං උබ සුමනෝ

මොකද බං මේ බෙරිහන් දෙන්නේ?

උබ දන්නැද්ද බං මේ වෙලා තියෙන වින්නනැහිය?

ඤමාකක්ද බං අද දවසටම එළියට බහින්න බැරිවුනා. ඉතිං මං කොහොමැයි...........

නවත්තගනින් බං ඔය කයිවාරුව. අන්න අපේ ලොකු හාමුදුරුවෝ අපවත් වෙලාලු

කතරගම දෙයි හාමුදුරුවනේ! මොකක්ද මේ වෙච්ච අපරාදය. බුදුන් නොදැකපු අපිට බෝධිසත්වයෙක් වගේ පිහිට වුණේ උන්වහන්සේ.

ගත වූ පැය කිහිපය තුළ සියල්ල සංවේදී කළ තරම්. ලොකු හාමුදුරුවන්ගේ ආදාහන පූජෝත්සවය ගමේ සියල්ලන්ගේ සහභාගීත්වයෙන් චාම්ව සිදු කළේ උන්වහන්සේගේ අවසන් කැමැත්ත අනුවය. එම ආදාහන පූජෝත්සවය පැවතුනේද

උන් වහන්සේ නිසා ගමට ලැබුණු වැව ආසන්නයේ නුග ගසට යාබදවය. චිතකයෙන් පිට වන දුම්රොඩු ගුවනට මුසු වේ. එම දුම් රොඩු හා එක්ව නුගරුකේ කොළත් මළානිකව ලෙළදෙන්නේ තම ශෝකය ප්‍රකාශ කරන ආකාරයටය.

ලොකු හාමුදුරුවන් සිහිවනු පිණිස මහ නුග සෑක පාමුල කුඩා පිළිම ගෙයක් තැණිනි. නුග ඹුල් පිළිමගෙය වටා එහා මෙහා වී පිළිමගෙය තම තුරුළට ගත්තේ කිසිවකු නොසිතූ තරම් වේගයෙනි. කාලයත් සමග පිළිම ගෙය නුග ගසේම කොටසක් බවට පත් විය. එය දකිනා ඕනෑම කෙනෙකුට හැගෙන්නේ මේ මහා රුක්ෂ රාජයා අතීත කතාවක් මුමුණන්නට සූදානම් වන බවය.

**නිමි**

# පසුවදන

